# කාන්තා ප්‍රඥප්තිය (ශ්‍රී ලංකා)

*(1993 මාර්තු මස 03 වැනි දින ශ්‍රී ලංකා රජය විසින් අනුමත කරන ලදි)*

## පූර්විකාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය සම තත්වයෙහි ලා සැලකීම ද ස්ත්‍රී පුරුෂ භාවය හේතුකොටගෙන ඇති වන වෙනස්කම්වලින් ඔවුන් නිදහස් කර ගැනීම ද මූලික අයිතිවාසිකමක් ලෙස පිළිගන්නා අතර, ඒ අයිතිවාසිකම් අධිකරණ මගින් බලාත්මක කිරීම සඳහා විධිවිධාන සලස්වා ඇති හෙයින් ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අස්ත්‍යර්ථක වූ ව්‍යවස්ථාදායක හා පරිපාලනමය මැදිහත් වීම් මගින් ස්ත්‍රී පුරුෂ විෂමතා තුරන් කිරීම සඳහා විධිවිධාන සලස්වා ඇති හෙයින් ද ;

විශ්ව මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයෙන්, වෙනස්කම් නොකිරීමේ මූලධර්මය තහවුරු කරමින් සකල මානව වර්ගයා ස්වාධීන හා සම අයිතිවාසිකම්වලට ද ගරුත්වයට ද හිමිකම් ලබා ඉපිද ඇති බවත් සෑම කෙනෙකු ම ස්ත්‍රී පුරුෂ භේදය පදනම් කරගත් කවර හෝ වෙනස්කමකින් තොර සියලුම අයිතිවාසිකම් වලට හා නිදහසට හිමිකම් දරන බවත් ප්‍රකාශ වන හෙයින් ද ;

ශ්‍රී ලංකාව විසින් මේ ජාත්‍යන්තර ප්‍රමිති අනුමත කර ඇති අතර, කාන්තාවන්ට එරෙහි වූ සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීමේ සම්මුතිය යටතේ වූ ජාත්‍යන්තර බැඳීම් අපරාණු මත කිරීමෙන් පිළිගෙන ඇති හෙයින් ද;

ශ්‍රී ලංකාවේ සමාජමය හා නෛතික සම්ප්‍රදායයන් මෙන් ම නීති හා ප්‍රතිපත්ති ද ස්ත්‍රී පුරුෂ දෙ පක්ෂය සම තත්ත්වයෙහි ලා සැලකීමේදී සහ ඔවුනට වෙනස්කම් නොකිරීමේ දී ඒ පිළිබඳ සාරධමර්වලට බොහෝ විට අනුබල දී ඇති හෙයින් ද ;

කාන්තාවන්ට එරෙහි ව පවත්නා වෙනස්කම් තවදුරටත් පවතින බව බලවත් සැලකිල්ලට ගනිමින් ද ස්ත්‍රී පුරුෂ භාවය මත ඇතිවන සාහසික ක්‍රියා මානව  අයිතීන් සහ මූලික නිදහස උල්ලංඝනය කිරීමක් බව පිළිගැනීමෙන් එවැනි ක්‍රියා කාන්තා අයිතීන් හා නිදහස භුක්ති විඳීමට බාධාකාරී වන බව නැතහොත් නිශේධනය වන බව ද පිළිගනිමින් ;

ස්ත්‍රී පුරුෂ සමානතාව මත සාක්ෂාත් කරගත් නීති, ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග නැවත තහවුරු කරමින්, බැඳීම් හා ප්‍රමිති ප්‍රතිෂ්ඨාපනය කිරීමේ අභිලාෂයෙන් ද ;

ප්‍රඥප්තියෙන් නිශ්චිත අයිතිවාසිකම්, මූලධර්ම හා ප්‍රතිපත්ති සියලු තැනැත්තන්, ආයතන, සංවිධාන හා ව්‍යාපාර විසින් ගරු කරනු ලැබීමේ සහ, මාර්ගෝපදේශ වශයෙන් යොදා ගනු ලැබේ ය යන අභිලාෂයෙන් ද ;

ශ්‍රී ලංකාවේ සියලු ජීවන ක්ෂේත්‍රවල දී ම, ස්ත්‍රී පුරුෂ සමානතාව පිළිගනිමින් යුක්තිය හා සාධාරණත්වය සහතික කිරීමේ අධිෂ්ඨානයෙන් ද ;

ශ්‍රී ලංකා ආණ්ඩුව මෙසේ ප්‍රකාශ කරයි :

I වන කොටස

**01**. රජය විසින්, කාන්තාවන්ගේ පූර්ණ සංවර්ධනය හා අභිවර්ධනය සහතික කරනු පිණිස ව්‍යවස්ථා ප්‍රඥාපනය කිරීම ඇතුළු, විශේෂයෙන් දේශපාලන, සමාජීයීය,ආර්ථික සහ සංස්කෘතික යන සියලු ක්ෂේත්‍රවල ම

එනම්, කාන්තාවන්ට පුරුෂ පක්ෂය හා සමාන පදනමක් මත මානව අයිතිවාසිකම් හා මූලික නිදහස ක්‍රියාත්මක කිරීම හා භුක්ති විඳීම සහතික කරලීමේ කාර්යය සඳහා උචිත සියලු පියවර ගත යුතුය.

දේශපාලන හා සිවිල් අයිතිවාසිකම්

**02** (i) රටේ දේශපාලන හා පොදු ජීවිතයෙහි මෙන්ම රාජ්‍ය හා පෞද්ගලික අංශවල ද කාන්තාවන්ට එරෙහි ව ඇති වෙනස්කම් තුරන් කිරීමෙහි ලා උචිත සියලු පියවර ගනිමින්, රජය විසින් කාන්තාවන්ට පුරුෂ පක්ෂය හා සමාන පදනමක් මත,පහත දැක්වෙන අයිතිවාසිකම් සහතික කර දිය යුතුය ;

(අ) සියලු ඡන්ද විමසීම් වල දී සහ ජනමත විචාරණවල දී ඡන්දය දීම සහ මහජනයා විසින් තෝරා පත් කරනු ලබන සියලු මණ්ඩලවලට තෝරා පත්වීමට සුදුස්සන් වීම,

(ආ) ජාතික, පළාත් හා ප්‍රාදේශීය ඡන්ද විමසීම්වල නාමයෝජනා ක්‍රියාවලියෙහි දී සාධාරණ නියෝජනයක් ලැබීම,

(ඇ) රජයේ ප්‍රතිපත්ති සකස් කිරීමේ දී සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ දී සහභාගී වීම, රජයේ තනතුරු දැරීම හා සියලු රාජ්‍ය මට්ටම්වල දී සියලු මහජන කටයුතු ඉටුකිරීම,

(ii)වෘත්තීය සංගම්වලට සහ දේශපාලන කටයුතුවලට සම්බන්ධ සංවිධාන හා සංගම්වල

කාන්තා සහභාගීත්වය රජය විසින් වැඩි දියුණු කළ යුතුය.

**03**. ජාත්‍යන්තර මට්ටමේ දී තම රජය නියෝජනය කිරීමේ සහ ජාත්‍යන්තර සංවිධාන කාර්යවල හා කටයුතුවල දී පුරුෂ පක්ෂය හා සමාන පදනමක් මත හා කිසි ම වෙනස්කමකින් තොර ව සහභාගී වීමේ අවස්ථා කාන්තාවන්ට සහතික කර දෙනු ලැබීමට රජය විසින් උචිත සියලු පියවර ගත යුතුය.

**04**. (i) තම රටවැසිභාවය අත් කර ගැනීමට, වෙනස් කිරීමට හෝ පවත්වා ගැනීමට පුරුෂ පක්ෂය හා සමාන අයිතිවාසිකම් භුක්ති විඳීමේ අයිතිය කාන්තාවන්ට සහතික කර දීමට රජය විසින් උචිත සියලු පියවර ගත යුතුය. කාන්තාවන් විදේශිකයකු සමග විවාහ වීම නිසා හෝ විවාහය වලංගුව පවත්නා අතරතුර හෝ සැමියාගේ රටවැසිභාවය වෙනස් කිරීමේ හේතුවෙන් හෝ ඇගේ රටවැසිභාවය නිතැතින්ම වෙනස් නොවන බවටත් සැමියාගේ පුරවැසිභාවය ඇය මත බලෙන් නොපැවරෙන බවටත් ඇයට ඒ හේතුවෙන් රටවැසි භාවය අහිමි වීමේ තත්ත්වයක් ඇති නොකෙරෙන බවටත් රජය විසින් විශේෂයෙන් සහතික කළ යුතුය.

(ii) තම දරුවන්ගේ රටවැසිභාවය සම්බන්ධ කරුණු තීරණය කිරීමේ දී පුරුෂයන්ට හා කාන්තාවන්ට සම අයිතිවාසිකම් භුක්ති විඳීමේ අයිතිය රජය විසින් සහතික කළ යුතුය.

(iii) මිශ්‍ර විවාහයක දී අඹු සැමි යුවලකට තම රුචිය පරිදි පොදු නීතිය යටතේ කටයුතු කිරීමේ අයිතිය රජය විසින් සහතික කළ යුතුය.

(iv) පුද්ගලයන් හට ඔබ මොබ යාමේත් තම පදිංචිය හා නිත්‍ය පදිංචිය තෝරාගැනීමේත් නිදහස ක්‍රියාත්මක කිරීමේ දී ඊට අදාල නීති සම්බන්ධයෙන් පුරුෂයන් හා කාන්තාවන් සම අයිතිවාසිකම් භුක්ති විඳීමේ අයිතිය රජය විසින් සහතික කළ යුතුය.

**05**. පුද්ගල නිදහස ද, පෞද්ගලික ආරක්ෂාව ද ඇතුළු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කරන ලද කාන්තාවන්ගේ මූලික අයිතිවාසිකම් හා සම නෛතික ආරක්ෂාවට ඇති අයිතිය සලසා දීමට රජය විසින් අවශ්‍ය සියලු පියවර ගත යුතුය.

**06**. සිවිල් කටයුතුවල දී පුරුෂයන්ගේ නෛතික ශක්‍යතාවන්ට සර්වසම වූ ශක්‍යතාවන් ක්‍රියාත්මක කිරීමට සම අවස්ථා, කාන්තාවන්ට ලබාදීමට ද රජය විසින් අවශ්‍ය පියවර ගත යුතුය.

පවුල් ඒකකය තුළ අයිතිවාසිකම්

**07**. (i) විවාහයට සහ විශේෂයෙන් පවුල් සම්බන්ධතාවලට අදාල සියලුම කටයුතුවල දී කාන්තාවන්ට එරෙහි ව ඇති වෙනස්කම් තුරන් කිරීමෙහි ලා අවශ්‍ය සියලු උචිත පියවර ගැනීමට සහ පුරුෂ පක්ෂය හා සමාන පදනමක් මත පහත දැක්වෙන අයිතීන් තහවුරු කිරීමට රජය විසින් ක්‍රියා කළ යුතුය :-

(අ) විවාහයට එළඹීමේ සම අයිතිය;

(ආ) සහකරු තෝරා ගැනීමේ හා ස්වාධීන වූත් පූර්ණ වූත් ස්ව කැමැත්ත මත පමණක් විවාහයට එළඹීමේ සම අයිතිය;

(ඇ) විවාහක කාලය තුළ මෙන්ම, විවාහය අවලංගු කිරීමේ දී ද සම අයිතිවාසිකම් සහ වගකීම් දැරීමේ අයිතිය; (ඈ)වෛවාහක තත්ත්වය කුමක් වුව ද විවාහක හෝ අවිවාහක දෙමව්පියන්ගේ දරුවන් වශයෙන් කවර ආකාරයක හෝ වෙනසක් සිදු නොවන පරිද්දෙන්, දරුවන්ගේ යහපත ප්‍රමුඛත්වයෙහි ලා සලකමින්, තම දරුවන්ට අදාළ කටයුතුවල දී දෙමව්පියන් වශයෙන් සම අයිතිවාසිකම් හා වගකීම් දැරීම;

(ඉ) දරුවන් සංඛ්‍යාව හා දරු උපත් පරතරය පිළිබඳ ව නිදහස්ව සහ වගකීව යුතු ලෙස තීරණය කිරීමේ අයිතිය හා මේ අයිතීන් ක්‍රියාත්මක කරනු පිණිස තොරතුරු, අධ්‍යාපනය සහ උපාය මාර්ග ලබා ගැනීමේ සම අයිතිවාසිකම්;

(ඊ) ජාතික ව්‍යවස්ථාවල පිළිගත්, ආරක්ෂකත්වය, රක්ෂිතභාරකාරත්වය, භාරකාරත්වය සහ ළමයින් දරුකමට හදා ගැනීම හෝ මේ සංකල්ප පවත්නා සමාන ආයතන ඒ සංකල්ප පිළිගෙන ඇති අවස්ථාවල දී ඒ හා සම්බන්ධ සමාන අයිතිවාසකම් සහ වගකම්;

(උ) සැමියා හා බිරිඳ වශයෙන් පවුල් නාමය, පදිංචිය හා නිත්‍ය පදිංචිය තෝරා ගැනීමේ අයිතිය ඇතුළු සමාන පුද්ගල අයිතිවාසිකම්;

(ඌ) දේපල අයිතිය අත්පත් කර ගැනීම, කළමනාකරණය, පරිපාලනය භුක්ති විඳීම, හා බැහැර කිරීම සම්බන්ධයෙන් අඹු සැමි දෙ දෙනාට සම අයිතිවාසිකම්;

(ii) විවාහය සැලකිල්ලට ගනිමින්, කෙනෙකුගේ දරුවන් නොවන යම් තැනත්තකු වෙත චංචල හෝ නිශ්චල දේපල පැවරීම තහනම් කිරීම සඳහා ඒ පැවරීම, පවත්නා ආගමික නීති යටතේ නීත්‍යානුකූල වන්නේ නම් හැර, රජය විසින් ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබිය යුතුය.

**08**. (i) රජයේ ලියාපදිංචි කිරීමේ කාර්යාලයක, විවාහ ලියාපදිංචි කිරීමේ අවස්ථාව රජය විසින් ලබා දිය යුතු අතර, විවාහ වීමේ අවම වයස අවුරුදු 18 ලෙස නියම කිරීමට රජය විසින් නීති පැනවිය යුතුය. මේ නීතිය ප්‍රසිද්ධියට පත් කිරීමට සහ මේ වයසට අඩු වයසින් එකට ජීවත් වන යුවලකගේ සම්බන්ධතාවන් ආරක්ෂා

කිරීමේ අරමුණින් නියමිත අතුරු කාල සීමාවන් තුළ දී ඊට සම්බන්ධතා ලියාපදිංචි කිරීමට විශේෂ පියවර ගත යුතුය.

(ii) විවාහයක් කඩාකප්පල් වීම, විවාහය අවලංගු කිරීමේ පදනම බව රජය විසින් පිළිගත යුතු අතර, පවුලේ නඩත්තුව, මවුපිය දෙ පාර්ශවයේ අයතිවාසිකම් හා වගකීම් විවාහය අවලංගු කිරීමෙන් සහ නිෂ්ප්‍රභා කිරීමෙන් පසු දෙ දෙනා ම සම සේ දැරිය යුතු බව පිළිගත යුතුය.

(iii) පවුල් ආරවුල් සමථයකට පත් කිරීමට රජය විසින් නිසි පියවර ගත යුතු අතර අදාළ කවර තැනක දී වුව ද පෞද්ගලිකත්වයට සහ රහස්‍යභාවයට ඇති අයිතිය පිළිගත යුතු ය.

අධ්‍යාපනයට සහ පුහුණු වීමට ඇති අයිතිය

**09**. (i) පුරුෂයන් හා කාන්තාවන් සඳහා:

(අ) පෙර පාසල්, ප්‍රාථමික, ද්විතියික හා තෘතියික අධ්‍යාපනය ද මිශ්‍ර අධ්‍යාපනය නොවිධිමත් අධ්‍යාපනය සහ අඛන්ඩ අධ්‍යාපනය, ඇතුළු තාක්ෂණික, රැකියා පුහුණු සහ වෘත්තිය අධ්‍යාපනය ද පුහුණු හා ව්‍යාප්ති වැඩ සටහන් ද යන සමාන අධ්‍යාපන අවස්ථාවලට පවිසීම.

(ආ) අවුරුදු 10 ක අනිවාර්ය අධ්‍යාපනය සඳහා පවිසීමේ අවස්ථාව:

(ඇ) ශිෂ්‍යත්වවලින් සහ අධ්‍යයන ප්‍රදානවලින් ප්‍රතිලාභ ලබා ගැනීමේ සම අවස්ථා සැලසීම:

(ඈ) එක සමාන විෂයමාලා, විභාග, සහතික පත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලි, පාසල්වල සමාන තත්ත්වයක වූ සුදුසුකම් හා පහසුකම් ඇති ආචාර්ය මණ්ඩල යනාදියට ද පුහුණු වීමේ වැඩසටහන්, සම තත්ත්වයේ උපකරණ යනාදියට ද පිවිසීම සහ ශාරීරික හා සෞන්දර්ය අධ්‍යාපනයෙහි ක්‍රියාශීලීව සහභාගී වීමට සම අවස්ථා ලබා දීම: හා

(ඉ) වෘත්තිය සහ රැකියා පුහුණු මාර්ගෝපදේශක සහ උපදේශක වැඩ සටහන්වලට පිවිසීමේ අවස්ථා ලබාදීම සහතික කිරීම:

සඳහා රජය විසින් සියලු පියවර ගනු ලැබිය යුතුය.

(ii) ආබාධිත පුද්ගලයන් සිටිනා පවුල්වල, මූලික වගකීම පැවරෙන්නේ කාන්තාව මත බව පිළිගනිමින්, ඒ ආබාධිත පුද්ගලයන්ට, අධ්‍යාපනයට හා පුහුණු කටයුතුවලට පිවිසීමේ සම අවස්ථා රජය විසින් සහතික කිරීම.

(iii) ජාතික ප්‍රතිපත්තිය ප්‍රකාර දරුවන්ගේ පරම යහපත තකා ඔවුන්ගේ අධ්‍යාපන මාධ්‍යය තෝරා ගැනීමේ දී මවටත් පියාටත් සම අයිතිය රජය විසින් සහතික කළ යුතුය.

(iv) ඉගැන්වීමේ සහ ඉගෙන ගැනීමේ ද්‍රව්‍ය ප්‍රතිශෝධනය කිරීමෙන්, පිළියෙළ කිරීමෙන් සහ ලිවීමෙන්, සෑම ආකාරයේ අධ්‍යාපනයක ම ඇතුළත් විෂය කරුණු හා අධ්‍යාපනික ලේඛන ලිපිද්‍රව්‍ය ආදියෙහි අන්තර්ගත, ස්ත්‍රී-පුරුෂ භාවය පදනම් කර ගත් ආකෘතික සංකල්ප තුරන් කිරීම සහතික කිරීමෙහි ලා රජය විසින් සියලු පියවර ගත යුතුය.

(v) කලින් පාසල් හැර යන්නන්ගේ සංඛ්‍යාව අඩු කිරීමට සහ නියමිත කාලයට පෙර පාසල හැර ගිය බාලිකාවන් සහ කාන්තාවන් වෙනුවෙන් වැඩසටහන් සංවිධානය කිරීමට රජය විසින් සියලු උචිත පියවර ගත යුතුය.

ආර්ථික කටයුතුවලට සහ එහි ප්‍රතිලාභවලට ඇති අයිතිය

10. (i) ආර්ථිකයේ, විධිමත් සහ අවිධිමත් අංශවල නියුතු සියලු ම කාන්තාවන් සහ පුරුෂයන් වෙනුවෙන්:

(අ) මූල්‍ය ප්‍රතිලාභ සඳහා ආර්ථික කටයුතුවල නිරත වීමේ සම අයිතිය සහතික කිරීම:

(ආ) සේවයට බඳවා ගැනීම,තිසි තනතුරුවලට පත්කිරීම, උසස් කිරීම, සේවා කොන්දේසි සහ රැකියා සුරක්ෂිත භාවය සම්බන්ධයෙන් ස්ත්‍රී-පුරුෂ භාවය පදනම් කරගනු ලැබූ වෙනස්කම්වලින් තොරව, රාජ්‍ය, පෞද්ගලික සහ අනියම් අංශවල සේවා නියුක්තිය සම්බන්ධ සියලු මට්ටම්වල දී සම අයිතිය සහ සම අවස්ථා ලබා දීම.

(ඇ) වෘත්තිය පුහුණුව, නැවත පුහුණුව, සේවාස්ථ පුහුණුව සහ ආධුනිකත්වය සම්බන්ධයෙන් සම අවස්ථාවලට පිවිසීම.

(ඈ) (i) ජනාවාස ඉඩම් ඇතුළු ඉඩම් අයිතියට සහ ඉඩම් සම්බන්ධ, අනිකුත් අයිතිවාසිකම් භුක්ති විඳීමේ සම අවස්ථා සහ ඉඩම් සහ කෘෂිකාර්මික ප්‍රතිසංස්කරණ, සම්බන්ධයෙන් සමාන ව සැලකීම.

(ii) කෘෂිකාර්මික බැර සහ ණය, වෙනත් ආකාරයේ බැර අලෙවි පහසුකම් සහ ව්‍යාප්ති සේවා වැනි සම්පත් සම්බන්ධයෙන් සම පිවිසීම.

(ඉ)වැඩි දියුණුකළ තාක්ෂණය ඇතුළු උචිත තාක්ෂණයෙන් ප්‍රයෝජන ගැනීමේ සම අවස්ථා සහතික කිරීමෙන්

(i) කාන්තාවන්ගේ ආදායම වැඩි දියුණු කිරීමේ මාර්ග සැලසීම:

(ii) නිවසේ දී, කාර්යස්ථානයේ දී සහ ප්‍රජාවෙහි පුරුෂයන් සහ කාන්තාවන්, සිය වගකීම් සම සේ බෙදා ගන්නා පරිදි, ආර්ථික සහ ආර්ථික නොවන කටයුතුවල දී කාලයත් ශ්‍රමයත් අඩු කිරීම:

(ඊ) සම අගයක් ඇති කාර්යවලදී සහ ඒ කාර්ය ඇගයීමේ දීත් ප්‍රතිලාභ ඇතුළු සමාන පාරිශ්‍රමික ලැබීමේ සහ සමාන සැලකීමක් ලැබීමේ අයිතිය:

(උ) සමාජ රැකවරණය උදෙසා විශේෂයෙන් විශ්‍රාම ගැනීම, සේවා නියුක්තිය, අසනීපවීම, මහලු වයස සහ කාර්යයක යෙදීමට නොහැකි වීම සම්බන්ධ අවස්ථාවල දී සම අයිතිය.

(ඌ) දරුවන් සුරැකීම, පවුල් වගකීම් සපුරාලීම හෝ නීතියෙන් පිළිගත් වෙනත් යම් හේතූන් සඳහා නිවාඩු ගැනීමේ සහ එසේ නිවාඩු ගැනීමෙන් පසු නැවත සේවයට පැමිණීමේ අයිතිය;

(එ )සෞඛ්‍යාරක්ෂාව සඳහා සහ කාර්යස්ථානවල ආරක්ෂා සහිත සහ ආරක්ෂාව සලසන උපකරණ ද ඇතුළු,සෞඛ්‍යයට අහිතකර සියලු අපද්‍රව්‍යවලින් තොර වූත් ආරක්ෂාව සහිත වූත් තත්ත්වයන් සම්බන්ධයෙන් සමාන අයිතිවාසිකම;

(ඒ) ආරක්ෂා සහිත පානීය ජලය ද, ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් ද, මූලික සෞඛ්‍ය සහ සුභසාධන පහසුකම් ඇතුළු සෞඛ්‍යයට හිතකර වාතාවරණයක කාර්යයෙහි යෙදීමේ සම අවස්ථාව; හා

සහතික කිරීමෙහි ලා සියලු උචිත පියවර රජය විසින් ගනු ලැබිය යුතුය.

(ii) කාන්තාවන්ගෙන් පවුලට වන සේවය පිළිගැනීම ද රජයේ සංවර්ධන වැඩසටහන් වල දීත් ප්‍රතිලාභ සමසේ බෙදීමේ දීත් යෙදී ඇති වගකීම්වල දීත් පුරුෂයන් හා සම අවස්ථා ඇති බව සහතික කෙරෙන පරිදි, රජය විසින් ගෘහ මූලිකයා යන පදය නැවත අර්ථකථනය කළ යුතුය.

11. විවාහය හෝ මාතෘත්වය මත කාන්තාවන්ට එරෙහිව වෙනස්කමක් වැළැක්වීම පිණිස හා සේවාවන්හි යෙදීමේ ඵලදායී අයිතිය සහතික කිරීම පිණිස පහත දැක්වෙන පරිදි රජය විසින් උචිත පියවර ගත යුතුය.

(i) ප්‍රසූති නිවාඩු සහ ප්‍රතිලාභ ලබා දීම සහ භුක්ති විඳීම සහතික කිරීම, දෙමව්පියන්ගේත්, ප්‍රජාවේත් වගකීමක් බව සහතික කිරීම.

(ii) මව්පිය දෙදෙනාට ම ප්‍රසූති නිවාඩු ලබාදීම සඳහා කටයුතු කිරීම.

(iii) දැනට යෙදී සිටින සේවයේ ජ්‍යෙෂ්ඨතාව හෝ සමාජ දීමනා අහිමිවීමක් නොමැතිව, වැටුප් සහිත හෝ සංසන්දනීය සමාජ ප්‍රතිලාභ සහිත ප්‍රසූත නිවාඩු ලබා දීම උත්සුක කිරීම සහ ඒ පිළිබඳ නීතිමය විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා මව්කිරි දීම සඳහා විධිවිධාන සැලැස්වීම.

(iv) විවාහය, ගර්භණීභාවය හෝ ප්‍රසූති නිවාඩු යන කරුණු මත (වෙනත් හේතුවක් බව අඟවමින් හෝ එසේ නැතිව) සේවයෙන් පහ කිරීම සඳහා සහ සේවයෙන් පහ කිරීමේ දී විවාහක තත්ත්වය නිසා වෙනස් කොට සැලකීම තහනම් කිරීම හා එසේ සේවයෙන් පහ කළ විට දඩුවම් පැමිණ වීම.

(v) කාර්ය සම්බන්ධ වගකීම්, පවුල කෙරෙහි ඇති බැඳීම් සමඟ ඒකාබද්ධ කිරීමට, විශේෂයෙන් ළමා සුරැකුම් ජාලයක් පිහිටුවීමෙන් හා සංවර්ධනය කිරීමෙන්, සමාජ කටයුතුවලට සහභාගී වීමට මව්පියන්ට අවස්ථාව ලබා දීම සඳහා අවශ්‍ය ආධාරක සමාජ සේවා පිළිබඳ නීතිමය විධිවිධාන සැලැස්වීම සඳහා දිරි ගැන්වීම සහ ඒ විධිවිධාන ක්‍රියාත්මක කිරීම;

(vi) හැකි සෑම අවස්ථාවක දී ම, අඹු සැමි දෙදෙනාට ම එකම භූගෝලීය ප්‍රදේශයක් තුළ රැකියාව කිරීමට අයිතිය සහතික කිරීම; සහ

(vii) ගර්භණී කාන්තාවන්ට සහ නූපන් දරුවාට හානි කර වන අන්දමේ රැකියාවල, ගර්භණී කාලය තුළ දී කාන්තාවන් යොදවා ගැනීම තහනම් කිරීම;

12 පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් රජය විසින් උචිත පියවර ගනු ලැබිය යුතුය;

(i) රැකියාවක් කිරීමේ අවම වයස අවුරුදු 15 ක් විය යුතුබව නීති මඟින් සහතික කිරීම;

(ii) පදිංචිය අත හැර විදේශගත වන සියලු කාන්තාවන්ගේ අයිතිවාසිකම් මෙරට සහ සත්කාරක රට අතර ද්විපාක්ෂික ගිවිසුම මඟින් දෙ රට තුළදී ම ආරක්ෂා කරන බවට සහතික කිරීම;

(iii) කාර්මික සේවකයන්ගේ ආරක්ෂාව උදෙසා වූ සියලු නීති සියලුම කාර්මික අංශයන්හි, නිසි පරිදි ක්‍රියාත්මක වන බව සහතික කිරීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් හා සම්බන්ධතා යටතේ නොවන පරිදි ආරක්ෂා කිරීම සඳහා, නව නීති සම්පාදනය කිරීම;

(iv) විශේෂයෙන් ම බැංකු ණය, උකස් හා වෙනත් ආකාර මූල්‍ය ණය ලබා ගැනීමේ අයිතිය සහතික කරනු පිණිස, ආර්ථික සහ සාමාන්‍ය ජීවිතයේ වෙනත් අංශවල දී ද ස්ත්‍රී පුරුෂ සමානතා පදනමක් මත කාන්තාවන්ට එරෙහිව ඇති වෙනස්කම් තුරන් කිරීමෙහි ලා සියලු උචිත පියවර ගැනීම;

(v) දළ ජාතික නිෂ්පාදිතය ඇතුළු, කාන්තාවන් රටට ලබා දෙන ආර්ථික, සමාජ හා සංස්කෘතික දායකත්වය නිරූපණය කෙරෙන ස්ත්‍රී පුරුෂ භාවය මත එකතු නොවූ දත්ත සහ තොරතුරු එක්රැස් කිරීම, වර්ග කිරීම සහ ලබා ගැනීමට සැලැස්වීම;

(vi) සේවා නියුක්තිය සහ ස්වයං සේවා නියුක්තිය මඟින් ආර්ථික දියුණුවක් ලබා ගැනීමේ සම අවස්ථා සඳහා අවශ්‍ය විට ස්වශක්ති කණ්ඩායම් සහ සමූපකාර සමිති සංවිධානය කිරීම; සහ

(vii) වැඩ කරන කාන්තාවකට ගෙවිය යුතු පාරිශ්‍රමිකය, වැටුප, ප්‍රතිලාභ හෝ දීමනා සියල්ල සේවායෝජකයන් විසින් ඇයට කෙළින්ම ගෙවීමට සැලැස්වීම;

සෞඛ්‍යාරක්ෂාවට සහ පෝෂණයට ඇති අයිතිය

13 (i) රජය විසින්, කිසිම වෙනස්කමකින් හෝ විශේෂත්වයකින් හෝ තොර ව ස්ත්‍රී පුරුෂ දෙ පක්ෂයටම පහත සඳහන් දෑ සහතික වශයෙන් ලබාදිය යුතුය.

(අ) ස්ත්‍රී පුරුෂ සමානතා පදනමක් මත, සෞඛ්‍යාරක්ෂක තොරතුරු ද, පෝෂණ අධ්‍යාපනය ඇතුළත් සෞඛ්‍යාරක්ෂක අධ්‍යාපනය සහ තොරතුරු ද රෝග නිවාරණ හා ප්‍රතිකාර සේවා ඇතුළු අනිකුත් සේවා සහ උපදෙස් ද ලබා ගැනීමේ සම අවස්ථා සහ පවුලේ ආහාර සම්පත් සාමාජිකයන් අතර සමව බෙදා ගැනීම;

(ආ) ලිංගිකව සම්ප්‍රේෂණය ව න රෝග පිළිබඳ තොරතුරු, අධ්‍යාපනය, උපදෙස් සහ ප්‍රතිකාර ලබා ගැනීමට සැලැස්වීම;

(ii) පහත සඳහන් දෑ රජය විසින් විශේෂයෙන් සහතික වශයෙන් ලබාදිය යුතු ය;

(අ) රෝගීන් සම්බන්ධයෙන් වෛද්‍යමය සහ මනස් චිකිත්සක ප්‍රතිකාර පිළිබඳ නිසි මානුෂික පහසුකම් සැලසීම ඇතුළු කාන්තාවන්ගේ මානසික සහ කායික සෞඛ්‍ය වර්ධනය කෙරෙන සහ ආරක්ෂා කෙරෙන වැඩසටහන් අධ්‍යනය කිරීමට අවස්ථා සැලසීම ද වයස්ගත ආබාධිත කාන්තාවන් සඳහා සමාජීයීය ආධාර ක්‍රියා මාර්ගවලට අවස්ථා සහතික කිරීම;

(ආ) ගර්භණීභාවය, දරු ප්‍රසූතිය සහ පශ්චාත් ප්‍රසව කාලය සම්බන්ධයෙන් සෞඛ්‍යාරක්ෂාව අතින් ලබා දිය හැකි උසස්තම තත්ත්වයන් සහ උසස් සේවාවන් සැලසීම ද අවශ්‍ය විට නොමිලේ සේවා සහ සමාජීයීය ආධාර ලබා දීම ද ගර්භණී කාලය තුළ සහ මව්කිරි දීමේ කාලය තුළ ප්‍රමාණවත් විවේකය ලබා දීම ද සිරගත ගර්භණී කාන්තාවන්ට විශේෂ ආරක්ෂාව සැලසීම ද;

(iii) (අ)උපත් පාලනය කිරීමට කාන්තාවන්ට ඇති අයිතිය පිළිගැනීම සහ ආරක්ෂිත පවුල් සැලසුම් උපක්‍රම හා ඒවායේ ආරක්ෂිත භාවය පිළිබඳ රීති පැනවීම සහ බලාත්මක කිරීම ඇතුළු පවුල්

සැලසුම් කිරීම සම්බන්ධ තොරතුරු, අධ්‍යාපන, උපදෙස් හා සේවා ලබා ගැනීමේ අවස්ථාවලට කාන්තාවන්ට ඇති අයිතිය පිළිගැනීම;

(ආ) උපත් පාලනය පිළිබඳ කටයුතුවල දී ඒ ප්‍රතිපත්ති පුරුෂයන්ට සහ කාන්තාවන්ට එක සේ බලපාන බව සහතික කිරීම; සහ

(ඇ) සෑම අවස්ථාවකදී ම දරුවන්ගේ යහපත, ප්‍රධානතම අරමුණ බව පිළිගෙන දෙමව්පියන් වශයෙන් පවුල හා සමාජය හා සම්බන්ධ වගකීම්වලට හිමිකම්, දෙදෙනා අතර සාධාරණ ව බෙදිය යුතු බව අවබෝධ කර ගැනීම පවුල් අධ්‍යාපනයෙහි ඇතුළත් වන බව.

සමාජ වෙනස්කම්වලින් ආරක්ෂා වීමේ අයිතිය

පහත සඳහන් සියලු දෑ කිරීමට රජය සියලු උචිත පියවර ගත යුතුය.

14. (i) ස්ත්‍රී පුරුෂ හීනමානය නැතහොත් උච්චමානය පිළිබඳ අදහස මත ද ඔවුන් විසින් ඉටු කරනු ලබන ආකෘතික මෙහෙයයන් මත ද පදනම් වූ අගති හා ගතානුගතික වූ හෝ වෙනත් සියලු පුරුදු තුරන් කිරීමේ අරමුණින් සමාජ සහ සංස්කෘතික ආකල්ප ප්‍රවර්ධනය කිරීම;

(ii) සියලු ආකාර ජනමාධ්‍යවල, නිශේධනාත්මක ප්‍රතිබිම්බ නිරූපණය කිරීම වැළැක්වීම; සහ

(iii) කාන්තාවන් සහ ළමයින් සම්බන්ධ සියලු ආකාරයේ අනිසි ප්‍රයෝජන ගැනීම්, හොර ජාවාරම් සහ වෛශ්‍යා වෘත්තියෙහි යෙදවීම් තුරන් කිරීම.

15. රජය විසින්

(i) වැන්දඹුවන්, දික්කසාද වූ කාන්තාවන්, තනි මව්වරුන්, තනි කාන්තාවන් සහ පීඩාවලට ලක්විය හැකි වෙනත් කාන්තා කොටස්, සමාජයේ හෙළා දැක්මට ලක් නොවීමට;

(ii) එවැනි කාන්තාවන් සමාජීයිය සහ ආර්ථික වෙනස්කම් වලට ලක් නොකිරීම සහතික කිරීමට; සහ

(iii) සමාජ ප්‍රවාහයේ සෑම කටයුත්තක දී ම කාන්තා සහභාගීත්වය සහතික කෙරෙන ඵලදායි ක්‍රියා මාර්ග ගැනීමට;

කටයුතු කරනු ලැබිය යුතුය.

ස්ත්‍රී පුරුෂ භේදයෙන් ඇති වන සැහැසි ක්‍රියාවලින් ආරක්ෂාවීමේ අයිතිය

16. සමාජයෙහිත් කාර්ය ස්ථානයෙහිත් පවුල තුළත් අත්අඩංගුවේ සිටින විටත් කාන්තාවන්ට, ළමයින්ට, සහ තරුණ තැනැත්තන්ට එරෙහි ව කෙරෙන සැහැසි ක්‍රියා විශේෂයෙන්ම, ස්ත්‍රී දූෂණය, ව්‍යාභිචාරය, ලිංගික තාඩන පීඩන, කායික හා මානසික ආක්‍රෝෂය,වධහිංසා සහ කෲර, අමානුෂික අවමන්වලට ලක් කිරීම වැනි ක්‍රියා වැළැක්වීමට රජය විසින් සියලු පියවර ගත යුතුය.

එවැනි පියවර ගැනීමේ දී පහත සඳහන් දේ ද ඇතුළත් විය යුතුය.

(i) තාඩන පීඩන වලට ලක්වන කාන්තාවන්ගේ අයිතීන් පැහැදිලි ව පෙන්නුම් කරන හරවත් නීතිය සම්බන්ධයෙන් පමණක් නොව ඒවා වලක්වාලන ක්‍රියාමාර්ග සහ දණ්ඩනීය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ද, ව්‍යවස්ථාදායක ප්‍රතිශෝධනවලට අනුබල දීම;

(ii) කාන්තාවන්ට එරෙහිව එල්ල වන සාහසික අපරාධ සම්බන්ධයෙන් බලාත්මක අධිකාරීන්ට ක්‍රියා කිරීමේ හැකියාව ශක්තිමත් කෙරෙන පරිදි නීතිය බලාත්මක කිරීමේ යන්ත්‍රණය තුළ ව්‍යුහමය ප්‍රතිශෝධන ප්‍රවර්ධනය කිරීම සහ බලාත්මක කිරීමේ බලාධිකාරීන් දැනුවත් කිරීම;

(iii) යුධ ගැටුම් හා ජන කැළඹීම් ඇතුලු තාඩන පීඩනවලට ගොදුරු වූ කාන්තාවන්ට ආධාර හා උපදේශක සේවාවන් සලසන, රජයේ නොවන සංවිධාන, ප්‍රජා මූලික සංවිධාන සහ වැඩසටහන් ආදියට අනුබල දීම.

II වන කොටස

ජාතික කමිටුව ස්ථාපනය කිරීම

17. (1) මේ ප්‍රඥප්තිය තුළින් අපේක්ෂිත වගකීම් සාක්ෂාත් කර ගැනීමෙහි ලා ලැබ ඇති ප්‍රගතිය පිරික්සීමේ හා එහි අරමුණු සාධනය ඇගයීමේ කාර්යයන් සඳහා මෙහි මින් මතු 'කමිටුව' යනුවෙන් සඳහන් කරනු ලබන ජාතික කාන්තා කමිටුවක් ස්ථාපනය කරනු ලැබේ.

(2) කමිටුව සාමාජිකයින් 15 දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර,

(i) (අ) නීතිය

(ආ) සෞඛ්‍යය

(ඇ) ආර්ථික සංවර්ධනය

(ඈ) අධ්‍යාපනය

(ඉ) විද්‍යාව හා තාක්ෂණය

(ඊ) පරිසරය

යන ක්ෂේත්‍රවල විශිෂ්ඨත්වයක් ලැබුවා වූ ද පොදු පිළිගැනීමක් ඇත්තා වූ ද තැනැත්තන් අතුරෙන් දෙ දෙනෙකු බැගින් ශ්‍රී ලංකා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතුය;

(ii) කාන්තාවන්ගේ ස්වේච්ඡා සංවිධානවල හෝ කාන්තා කටයුතු ක්ෂේත්‍රයෙහි හෝ විශිෂ්ඨත්වයක් ලැබූ තැනැත්තන් අතුරෙන් දෙදෙනෙකු ශ්‍රී ලංකා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතුය.

තව ද,

(iii) දිප ව්‍යාප්ත රාජ්‍ය සේවයේ 1 වන පන්තියේ හෝ රාජ්‍ය නොවන අංශයේ එම තත්ත්වයට සමාන තත්ත්වයන් දරන, කාන්තා සංවර්ධනයට අදාළ කටයුතුවල අත්දැකීම් ඇති තැනැත්තකු විධායක අධ්‍යක්ෂ තනතුර සඳහා ශ්‍රී ලංකා ජනාධිපතිවරයා විසින් පත් කරනු ඇත. විධායක අධ්‍යක්ෂ, කමිටුවේ සාමාජිකයෙකු මෙන් ම, එහි පූර්ණකාලීන නිලධරයකු ද වන්නේය.

(iv) මේ කමිටුවේ සභාපති තනතුර සඳහා, මේ උප වගන්තියේ (i) වන සහ (ii) වන ජේද යටතේ පත් කරන ලද සාමාජිකයින් 14 දෙනා අතුරින් තැනැත්තකු ශ්‍රී ලංකා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතුය.

(v) ශ්‍රී ලංකා ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන පූර්ණකාලීන නිලධරයකු කමිටුවේ ලේකම් විය යුතුය.

18. (1) සභාපති හා කමිටුවේ අනිකුත් සාමාජිකයන් අවුරුදු 4 ක කාලයක් සඳහා ධූරය දැරිය යුතු අතර, තවත් අනුගාමී කාල පරිච්ඡේදයක් සඳහා නැවත පත්වීම ලැබීමට ඔවුන් හිමිකම් ලැබිය යුතුය.

(2) සාමාජිකයින් අතර ඇතිවන යම් පුරප්පාඩුවක් පිරවීම සඳහා සුදුසු තැනැත්තකු ශ්‍රී ලංකා ජනාධිපතිවරයාගේ අනුමතයට යටත් ව, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කරනු ලබන යම් තැනැත්තකු විසින් තම පූර්වගාමියාට අදාළ ධූර කාලයෙන් ඉතිරි වූ කාලය සඳහා ධූරය දැරිය යුතුය.

කමිටුවේ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතුය.

19. (අ) ස්ත්‍රී පුරුෂ භාවය මත ඇති වන වෙනස්කම් පිළිබඳ වූ පැමිණිලි පිළිගැනීම, සන්නිරීක්ෂණය හා ඒවා අදාළ පාලක බලධාරීන්, සම්බන්ධිත තැනැත්තන් හෝ මණ්ඩල වෙත අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා යොමු කිරීම;

(ආ) මේ ප්‍රඥප්තියේ ඇතුළත් විධිවිධාන කඩ කිරීම සම්බන්ධයෙන් වන පැමිණිලි, සහන, නෛතික ආධාර සහ හෝ සමථ සේවා සඳහා රජයේ හෝ රජයේ නොවන හෝ සංවිධාන වෙත යොමු කිරීම;

(ඇ) ඒ ක්‍රියාමාර්ග සමීක්ෂණය, අදාළ පාලන බලධාරීන්ගේ වාර්ෂික ප්‍රගති වාර්තා ලබා ගැනීම සහ මේ වාර්තා රට තුළ ප්‍රචලිත කිරීම ආදියට අවස්ථා සැලසීම;

(ඈ) මේ ප්‍රඥප්තියේ අන්තර්ගත ව ඇති පරිදි, කාන්තා අයිතිවාසිකම් සහ වගකීම් විෂයෙහි නෛතික සහ සංවර්ධන ප්‍රතිපත්තිවලින් ඇතිවන බලපෑම ඇගයීම;

(ඉ) අදාළ පර්යේෂණ දිරි ගැන්වීම තුළින් ප්‍රඥප්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට උපකාරී වීම සහ ඒ පර්යේෂණ පදනම් කර ගත් ප්‍රතිසංශෝධන සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම; සහ

(ඊ) කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳ ව, විෂයභාර ඇමතිනිය විසින් කමිටුවේ අවධානයට යොමු කෙරෙන කරුණු පිළිබඳ ව හෝ උචිත යයි කමිටුව සිතන කටයුතු කිරීමට හෝ ඇමතිනිය වෙත උපදෙස් දීම;

20 .(1) කමිටුවේ යම් රැස්වීමක ගණපූර්ණය සාමාජිකයන් 07 දෙනෙකු විය යුතු ය.

(2) යටත් පිරිසෙයින් මාස දෙකකට වරක් හෝ අවශ්‍යතා අනුව හැකි තාක් නිරතුරු ව ම කමිටුව රැස්විය යුතු ය.

21. (1)ඇමතිනිය වෙත අමතන ලද ලිපියක් යම් සාමාජිකාවකට සාමාජිකයෙකුට තම ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(2) තමා විසින් පත් කරන ලද කමිටු සාමාජිකයකු හෝ නිලධරයකු හෝ තනතුරින් ඉවත් කළ යුතු යැයි හැඟේ නම්, ශ්‍රී ලංකා ජනාධිපතිවරයා විසින්, ඔහු එසේ ඉවත් කරනු ලැබිය හැකි ය.

22. කමිටුවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබුණේ වුව ද කමිටුවට කටයුතු කළ හැකි ය.

23. විධායක අධ්‍යක්ෂවරයා යටතේ කටයුතු කරන පූර්ණකාලීන කාර්ය මණ්ඩලයක් සහිත ස්ථාවර කාර්යාලයක් සහ ලේකම් කාර්යාලයක් කමිටුවට තිබිය යුතු ය.

ජාතික කාන්තා කමිටුව,

ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය,

177, නාවල පාර,

නාරාහේන්පිට, කොළඹ 05,

ශ්‍රී ලංකාව.

දුරකථන අංක - 2368072

ෆැක්ස් - 2368072

ඊ- මේල්- ncwsl @ sltnet.lk

2005 සැප්තැම්බර්.